විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක : 01/2018

මගේ අංකය- විවැ/චක්‍රලේඛ/2018
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව
මාළිගාවත්ත
කොළඹ 10
2018/06/20

විදේශ දූත මණ්ඩල කාර්යාල ප්‍රධානීන්,
දිස්ත්‍රික් ලේකම්වරුන්,
ප්‍රාදේශීය ලේකම්වරුන්,

**විදේශගත ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම**

තම පෞද්ගලික හා රාජකාරි අවශ්‍යතාව මත විදේශගතව වාසය කරන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්හට, තම මාසික විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දිනයෙහි ම ලබා ගත හැකිවන අයුරින් හා මාසික විශ්‍රාම වැටුප් ගෙවීමේ නිවැරදි හා විධිමත් ක්‍රියාවලිය තව දුරටත් විධිමත් කිරීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

**02.** මෙම චක්‍රලේඛය නිකුත් කිරීමත් සමඟ,

- 1996.07.11 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/96
- 1997.12.26 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 3/96(1)
- 2007.01.22 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 4/2007
- 2010.04.06 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 16/2009 (ප්‍රතිශෝධන)
- 2011.06.30 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 5/2011
- 2014.11.21 දිනැතිව නිකුත් කරන ලද විශ්‍රාම වැටුප් චක්‍රලේඛ අංක 15/2014
- 2016.02.08 දිනැතිව නිකුත් කරන ලද විවැ/උපදෙස් ලිපි අංක 03/2016

යන චක්‍රලේඛ / ලිපි අවලංගු කරනු ලැබේ.

**03.** විදේශගත විශ්‍රාමිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ද,

- විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය,
- 1981 යුධ හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සේවා සංග්‍රහය,
- 1981 නාවික හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සේවා සංග්‍රහය,
- 1981 ගුවන් හමුදා විශ්‍රාම වැටුප් හා පාරිතෝෂික සේවා සංග්‍රහය,
- වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ආඥා පනත
- සන්නාහ සන්නද්ධ හමුදා වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත/ සන්නාහ සන්නද්ධ හමුදා වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් පනත

යන විධිවිධාන වලංගු වන බව අවධාරණය කරමි.

04. විදේශගත විශ්‍රාමිකයන්හට ද තම විශ්‍රාම වැටුප වෙනත් කෙනෙකුට පැවරීම, ඇටෝර්නි බලපත්‍ර ලබා දීම හෝ වෙනත් ගිණුම් හිමියෙකුගේ නමින් ගිණුම්ගත කිරීමට අවස්ථාව ලබා දීම සිදුකරනු නොලැබේ.

**විදේශගත විශ්‍රාම වැටුප් ලෙස තම විශ්‍රාම වැටුප ලබා ගත හැකි අවස්ථා**

05. ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා තම විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයන් හා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ ප්‍රථම ගෙවීම් අංශයෙන් විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කරන විශ්‍රාමිකයන් සඳහා විදේශ විශ්‍රාම වැටුප් ගෙවිය හැකිය. විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා විශ්‍රාමිකයාගේ පුරවැසිභාවය හා විදේශගතව සිටින කාලය පිළිබඳව සලකා බැලිය යුතුය. ඒ අනුව පහත I, II හා III හි දක්වා ඇති විශ්‍රාමිකයන් විදේශගත විශ්‍රාමිකයන් ලෙස සැලකේ.

I. **වෙනත් රටක පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්**

මෙම විශ්‍රාමිකයන් දීර්ඝ කාලීනව විදේශගතව සිටිය ද, ශ්‍රී ලංකාවේ වාසය කළ ද , වරින් වර විදේශගතව සිට ශ්‍රී ලංකාවට පැමිණිය ද ඔවුන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් පමණක් සිදුකළ යුතුය.

II. **ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්**

මෙම විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ද විශ්‍රාමිකයා විදේශ ගතව සිටින කාලය නොසලකා අනිවාර්යයෙන්ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් පමණක් ගෙවීමට කටයුතු කළ යුතුය.

III. **වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන්**

වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගතවීමක දී, වර්තමානයේ දී විශ්‍රාම වැටුප් ලබන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත දැනුම් දී තම විශ්‍රාම වැටුප, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් ලබා ගැනීම සඳහා කටයුතු කළ යුතුය.

06. **I. සේවා අවශ්‍යතාව මත වසර දෙකකට වඩා අඩු කාලයක් සඳහා විදේශගත වන විශ්‍රාමිකයන් හා පෞද්ගලික අවශ්‍යතාව මත මාස හය (06) - වසර දෙක (02) අතර කාලයක් සඳහා විදේශ ගතවන විශ්‍රාමිකයන්**

a) වසර දෙකක් හෝ ඊට අඩු කාලයක් සඳහා සේවා අවශ්‍යතාව මත විදේශගත වන විශ්‍රාමිකයන් හා පෞද්ගලික අවශ්‍යතාව මත මාස හය (06) - වසර දෙක (02) අතර කාලයක් සඳහා විදේශ ගතවන විශ්‍රාමිකයන්ගේ හා ඔවුන්ගේ යැපෙන්නන්ගේ පහසුව සලකා විශ්‍රාම වැටුප් ගෙවීම විශ්‍රාමිකයා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් සිදු කරනු ලැබේ.

b) මෙම විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් සිදු කිරීමේදී විශ්‍රාමිකයා විදේශගත වන දින සිට නැවත පැමිණෙන දින තෙක් ජීවන වියදම් දීමනාව රු.2000ක් හා වෙනත් දීමනා රු.3500ක් වන පරිදි ගෙවීම් සිදු කල යුතුය. මෙම විශ්‍රාමිකයන් පිළිබඳ ලේඛනයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් පවත්වාගෙන යායුතු අතර එම තොරතුරු සෑම වසරකම ජූනි 31 දින හා දෙසැම්බර් 31 දින විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබීමට සැලැස්විය යුතුය.

**II. පෞද්ගලික අවශ්‍යතාවය මත මාස හයක් (06) හෝ ඊට අඩු කාලයක් සඳහා විදේශගත වන විශ්‍රාමිකයන්**

මෙම විශ්‍රාම වැටුප් විදේශ විශ්‍රාම වැටුප් ලෙස නොසැලකේ. ඒ අනුව තම පෞද්ගලික අවශ්‍යතාවය මත හෝ විනෝද චාරිකා හෝ වන්දනා ගමන් හෝ පෞද්ගලික ගමන් සඳහා මාස හයක් (06) හෝ ඊට අඩු කාල සීමාවක් සඳහා විදේශ ගතවන විශ්‍රාමිකයන් හට විශ්‍රාම වැටුප් ගෙවීම සාමාන්‍ය පරිදි ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු කල යුතුය.

**07.** I. ප්‍රධාන කාර්යාලයෙන් ගෙවීම් කරන ඉහත 05 (I, II, III) හි දැක්වෙන විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුපට අදාල විශ්‍රාම වැටුප් ගොනුව නඩත්තු කිරීම, යාවත්කාලීන කිරීම හා විශ්‍රාම වැටුප් ආරම්භ කිරීම ද ප්‍රධාන කාර්යාලයෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් සිදු කෙරේ.

**II.** ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් ගෙවනු ලබන ඉහත 06 (I) කාණ්ඩයට අයත් විශ්‍රාම වැටුප් ගෙවීම, තානාපති කාර්යාල මගින් සහතික කරන ලද ජීවිත සහතික ලබා ගැනීම, විශ්‍රාම වැටුප් ගොනු නඩත්තු කිරීම හා යාවත්කාලීන කිරීම විශ්‍රාමිකයා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් සිදු කළ යුතුය.

**විදේශ විශ්‍රාම වැටුප ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ලේඛන**

**08.** ඉදිරියේ දී විදේශ විශ්‍රාම වැටුප් ලබා ගැනීමට අපේක්ෂිත ඉහත 06 (I) හි දැක්වෙන විශ්‍රාමිකයන් පහත සඳහන් ලේඛන තමා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත හා ඉහත 05 (I, II, III) හි දැක්වෙන විශ්‍රාමිකයන් පහත සඳහන් ලේඛන විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත විදේශගතවීමට මාස දෙකකට පෙර ඉදිරිපත් කළ යුතු වේ.

a) නිවැරදිව සම්පූර්ණ කරන ලද ජීව දත්ත පත්‍රිකාව (www.pensions.gov.lk වෙබ් අඩවියෙන් බාගත කරන ලද)
b) විදේශ විශ්‍රාම වැටුප් ලබා ගැනීම සඳහා වන ඉල්ලීම් ලිපිය
c) මෑතක දී (මාස 6 ක් ඇතුළත දී ) ලබා ගත් 3.5cmx4.5cm ප්‍රමාණයේ වර්ණ ඡායාරූප දෙකක්
d) විදේශගත වීම සනාථ කරන වීසා බලපත්‍රය හෝ ස්ථිර පදිංචිය ලබාගත් සහතික හෝ පුරවැසිභාවය ලබාගත් සහතිකය හෝ කොන්ත්‍රාත් / තාවකාලික / අනියම් සේවා පදනම මත විදේශගත වේ නම් විශ්‍රාමිකයා විසින් සහතික කරන ලද සේවා ගිවිසුමෙහි ඡායාපිටපත
e) ශ්‍රී ලංකා රජයෙන් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයේ හෝ විදේශ රටකින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයේ පිටපතක්
f) අදාළ වර්ෂය සඳහා ලබා දෙන ජීවිත සහතිකය

09. උක්ත (a) සිට (f) දක්වා ලේඛන ඉදිරිපත් කිරීමේදී ඉහත 06 (I) හි දැක්වෙන විශ්‍රාමිකයන් සෘජුවම ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත හා ඉහත 05 (I, II, III) හි දැක්වෙන විශ්‍රාමිකයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත පෙනී නොසිටින්නේ නම් එම ලේඛන තමන් විදේශගතව සිටින රටෙහි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල/ මහ කොමසාරිස් කාර්යාල හෝ විදේශ දූත මණ්ඩලයෙහි බලයලත් නිලධාරියෙකු වෙතින් පමණක් සහතික කර යොමු කිරීමට කටයුතු කළ යුතුය. **(වෙනත් කිසිදු නිලධාරියෙකු හෝ පුද්ගලයෙක්/ආයතනයක් මගින් සහතික කරනු ලබන ලේඛන පිළිගනු නොලැබේ.)**

10. නිවැරදිව සම්පූර්ණ කළ ලේඛන බාර දුන් අවස්ථාවේදී ම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු නිලධාරීන්/ ප්‍රාදේශීය ලේකම් කාර්යාල නිලධාරීන් විසින් පරීක්ෂා කරනු ලබන අතර අසම්පූර්ණ අයදුම්පත් එම අවස්ථාවේදී ම ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිවැරදිව සම්පූර්ණ කළ අයදුම්පත් සඳහා කඩිනමින් විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම ආරම්භ කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු කරනු ලැබේ.

**විදේශගත විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාම වැටුප් ගෙවීම් ආරම්භ කිරීම**

11. වෙනත් රටක පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්, ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන් හා වසර දෙකකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් සඳහා ගෙවීම් කිරීම විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් පහත සඳහන් බැංකු ශාඛාවන්හි පවත්වා ගෙන යනු ලබන විශේෂිත බැංකු ගිණුම් මගින් පමණක් සිදු කෙරේ.

a) ලංකා බැංකුව - අගනුවර ශාඛාව
b) මහජන බැංකුව - රජීන ශාඛාව
c) පැන් ඒෂියා බැංකුව - බොරැල්ල ශාඛාව
d) හැටන් නැෂනල් බැංකුව - මාළිගාවත්ත ශාඛාව

12. විශ්‍රාමිකයා විසින් ඉහත බැංකුවලින් ඕනෑම එක් බැංකුවක **තනි පුද්ගල ඉතිරිකිරීමේ ගිණුමක්** විවෘත කළ යුතුය. ඒ සඳහා,

- ❖ අදාළ බැංකුවෙහි ගිණුම් විවෘත කිරීමේ ආකෘති පත්‍රය
- ❖ letter of consent
- ❖ KYC (Know Your Customer) ආකෘති පත්‍රය

යන ලේඛන නිසි පරිදි සම්පූර්ණ කර විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත පෙනී සිට විදේශ විශ්‍රාම වැටුප් අංශයෙන් අනුමැතිය ලබා ගෙන අදාළ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. නැතහොත් විදේශගතව සිටින රටෙහි ශ්‍රී ලංකාවේ තානාපති කාර්යාල/ මහ කොමසාරිස් කාර්යාල හෝ විදේශ දූත මණ්ඩලයෙහි බලයලත් නිලධාරියෙකු වෙතින් සහතික කර, විදේශ විශ්‍රාම වැටුප් අංශය වෙත ඉදිරිපත් කළ යුතු අතර, එම අයදුම්පත් විදේශ විශ්‍රාම වැටුප් අංශය මගින් අදාළ බැංකුව වෙත යොමුකර ගිණුම් විවෘත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉහත ලේඛන www.pensions.gov.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක)

13. විශ්‍රාමිකයන්ගේ පහසුව සඳහා විශ්‍රාම වැටුප් අදාළ විශේෂිත බැංකු ගිණුමේ සිට ,

- එම බැංකුවෙහිම වෙනත් බැංකු ශාඛාවක විශ්‍රාමිකයාගේ නමින්ම පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල ඉතිරිකිරීමේ ගිණුමකට

හෝ

- විශ්‍රාමිකයාගේ නමින් විදේශ බැංකුවක පවත්වාගෙන යනු ලබන තනි පුද්ගල ඉතිරිකිරීමේ ගිණුමකට

මාරුකර ගැනීමේ අවස්ථාව ලබා දෙනු ලැබේ. එලෙස මුදල් මාරුකිරීමේ දී විශ්‍රාමිකයාට අදාළ රටෙහි මුදල් ඒකකයට සරිලන විනිමය අනුපාතිකයට අනුව මුදල් ලබා ගැනීමේ අවස්ථාව හිමිවනු ඇත. විශ්‍රාමිකයා මුදල් හුවමාරු කර ගන්නා සෑම අවස්ථාවකදී ම මුදල් හුවමාරු කර ගැනීමේ පත්‍රිකාව සමඟ ජීවිත සහතිකය බැංකුව වෙත ලබා දිය යුතු වේ.

14. එලෙස බැංකු ගිණුම් අතර මුදල් හුවමාරු කිරීමට බලාපොරොත්තු වන විශ්‍රාමිකයන් තම ඉල්ලීම අදාල බැංකුව වෙත සෘජුව ඉදිරිපත් කළ යුතු අතර, බැංකුව විසින් දෙපාර්තමේන්තු වෙබ් අඩවිය පරික්ෂා කිරීමෙන් විශ්‍රාමිකයාගේ අනන්‍යතාව තහවුරු කර ගත යුතු වේ. අනන්‍යතාව තහවුරු කිරීම පිළිබඳ ව තවදුරටත් ගැටළු පවතී නම් බැංකුව විසින් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙන් විමසීමට කටයුතු කළ යුතුය.

15. සේවා අවශ්‍යතාව මත වසර දෙකකට වඩා අඩු කාලයක් සඳහා වන විදේශගත වීමක දී, විශ්‍රාම වැටුප විශ්‍රාමිකයා අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ලබා ගත හැකිය. එම විශ්‍රාම වැටුප පිළිගත් ඕනෑම වාණිජ බැංකුවක විශ්‍රාමිකයා නමින් පවත්වා ගෙන යනු ලබන තනි පුද්ගල බැංකු ගිණුමට ගෙවීමට කටයුතු කරන අතර එම ගිණුම් සඳහා **ATM කාඩ්පත් භාවිත කිරීම අවුරා තබනු ලැබේ.**

16. එසේම, විදේශ දූත මණ්ඩල කාර්යාල / මහ කොමසාරිස් කාර්යාල හරහා විදේශ විශ්‍රාම වැටුප් ගෙවීම මින් ඉදිරියට තව දුරටත් සීමා කරනු ලැබේ. එසේම අලුතින් ආරම්භ කරනු ලබන විදේශ විශ්‍රාම වැටුප් විශ්‍රාමිකයන්ගේ පහසුව සඳහා මින් ඉදිරියට විදේශ විශ්‍රාම වැටුප් අංශයේ මග පෙන්වීම මත පවත්වා ගෙන යනු ලබන බැංකු ගිණුම් මගින් පමණක් සිදු කෙරේ.

17. එක්සත් රාජධානිය, ඇමරිකා එක්සත් ජනපදය, ඕස්ට්‍රේලියාව, කැනඩාව හා ඉන්දියාව යන රටවල්වල මහ කොමසාරිස් කාර්යාල මගින් **දැනටමත් විදේශ විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයන් සඳහා පමණක් මහ කොමසාරිස් කාර්යාල හරහා මාසික විශ්‍රාම වැටුප් ගෙවීමට කටයුතු කරනු ලැබේ.**

18. විදේශගත විශ්‍රාමිකයන් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම, මුදල් හුවමාරු කිරීම ද ඇතුළු බැංකු ගිණුම් පිළිබඳ සියලු පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ විධිවිධාන පරිදි අදාල වාණිජ බැංකු විසින් ඉටු කරනු ඇත.

**එකතු වූ විශ්‍රාම වැටුප් ගෙවීම**

19. 2009 වර්ෂයට පෙර විදේශගත විශ්‍රාමිකයන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි පසු එකතු වන ලද විශ්‍රාම වැටුප ගෙවීම් කරන ලදී. නමුත් විදේශගත විශ්‍රාමිකයන් වෙත ද විශ්‍රාම වැටුප් දිනයේදී ම මාසික විශ්‍රාම වැටුප් ලබා ගැනීමේ අවස්ථාව උදා වන පරිදි 2009 වර්ෂයේදී විදේශ විශ්‍රාම වැටුප් අංශය පිහිටුවන ලදී. එබැවින් වර්තමානය වන විට හිඟ විශ්‍රාම වැටුප් ගෙවීමේ අවශ්‍යතාවය අවම වී ඇත. එසේ නමුත්,

- 2009 වර්ෂයට පෙර විශ්‍රාම වැටුප් ගෙවීම නතර කළ විශ්‍රාමිකයන්
- විධිමත් විශ්‍රාම වැටුප් ගොනු නොමැති විශ්‍රාමිකයන්
- ගෙවීම් ලේඛන නොමැති/ ලේඛන දිරාපත් වූ විශ්‍රාමිකයන්
- තාවකාලිකව විශ්‍රාම වැටුප් ගෙවීම් අත්හිටවූ විශ්‍රාමිකයන්

සඳහා එකතු වූ විශ්‍රාම වැටුප් ලබාගැනීමට ඉල්ලීම් ඉදිරිපත් වේ. එවැනි ඉල්ලීම් සලකා බැලීම හා ඉදිරි කටයුතු කිරීම සඳහා විශ්‍රාමිකයා විසින් පහත සඳහන් ලේඛන ඉදිරිපත් කල යුතු වේ.

a) අදාළ කාලය තුළ විශ්‍රාම වැටුප් නොගෙවූ බවට ප්‍රාදේශීය ලේකම් විසින් කරනු ලබන සහතිකය
b) අදාළ විශ්‍රාම වැටුප ලබා නොගත් බවට දිවුරුම් ප්‍රකාශයක්
c) අදාළ වර්ෂය සඳහා ලබා දෙන ජීවිත සහතිකය

20. මීට අමතරව

a) විධිමත් ව සකස් කරන ලද විශ්‍රාම වැටුප් ගොනුව
b) විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි දත්ත පද්ධතිය තුළ විශ්‍රාම වැටුප් නොගෙවූ බවට සටහන් වීම යන කරුණු සම්පූර්ණ වීම මත එකතු වූ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.

ඉහත ලේඛන අසම්පූර්ණ විශ්‍රාමිකයන්ගේ එකතු වූ විශ්‍රාම වැටුප් පිළිබඳ ඉල්ලීම් සලකා බැලිය නොහැකි අතර ඉදිරි මාසික විශ්‍රාම වැටුප් ගෙවීම් කිරීම පමණක් සළකා බලනු ලැබේ.

**ජීවිත සහතික ලබා දීම**

21. සෑම වසරකදීම දෙසැම්බර් මස 01 දින සිට ඊළඟ වර්ෂයේ මාර්තු මස 31 දක්වා කාලය තුළ සියලුම විදේශගත විශ්‍රාමිකයන් සිය ජීවිත සහතික ලබා දිය යුතුය. ප්‍රධාන කාර්යාලයෙන් ගෙවීම් කරන වෙනත් රටක පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන්, ද්විත්ව පුරවැසිභාවය හිමි විශ්‍රාමිකයන් හා වසර තුනකට වඩා වැඩි කාලයක් සඳහා විදේශගත වන ශ්‍රී ලාංකික විශ්‍රාමිකයන් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවෙහි ඉදිරි මෙහෙයුම් කවුළුව වෙත පැමිණ හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල මඟින් ප්‍රධාන කාර්යාලය වෙත තම ජීවිත සහතික ලබා දිය යුතුය.

22. ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් ගෙවීම් කරන සේවා අවශ්‍යතාවය මත විදේශගත වන විශ්‍රාමිකයන් විදේශ දූත මණ්ඩල කාර්යාල හරහා ලබා ගත් ජීවිත සහතික ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබා දිය යුතුය.

23. පෞද්ගලික අවශ්‍යතාව මත මාස 06ක් හෝ ඊට අඩු කාලයක් සඳහා විදේශ ගතවන විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විදේශ විශ්‍රාම වැටුප් ලෙස නොසැලකේ. එම විශ්‍රාමිකයන් ජීවිත සහතික ලබාදීම සාමාන්‍ය පරිදි ග්‍රාම නිලධාරීන් මඟින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා සිදු කළ යුතුය.

24. වයස්ගත බව හෝ රෝගී බව මත තානාපති කාර්යාලයට යාමට නොහැකි විශ්‍රාමිකයන් හට අදාල රටෙහි පිළිගත් වෛද්‍යවරයෙක් මඟින් ලබා ගන්නා ලද ජීවිත සහතිකය තානාපති කාර්යාලය මඟින් සහතික කර ලබා දිය හැකිය. තානාපති කාර්යාල විසින් සහතික නොකළ ජීවිත සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**25. විදේශගත විශ්‍රාමිකයන් නිසි පරිදි සම්පූර්ණ කර සහතික කරන ලද ජීවිත සහතික තමන් විසින් හෝ විදේශ දූත මණ්ඩල කාර්යාල හරහා පමණක් දෙපාර්තමේන්තුව වෙත ලබාදිය යුතු අතර ඥාතීන්, නියෝජිතයන් හෝ ඇටෝර්නි බලපත්‍රකරුවන් මඟින් දෙපාර්තමේන්තුව වෙත ජීවිත සහතික ලබාදීමේ බලය මෙම චක්‍රලේඛය ක්‍රියාත්මක වීමත් සමඟ අවලංගු කරනු ලැබේ.**

26. ජීවිත සහතික ලබාදීම සම්බන්ධයෙන් වූ උපදෙස් අදාල වර්ෂයන්හිදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වෙබ් අඩවියෙහි යාවත්කාලීන කරනු ලැබේ.

27. විදේශ දූතමණ්ඩල කාර්යාල හරහා ලබා දෙන ජීවිත සහතික විදේශ දූත මණ්ඩල කාර්යාල මඟින් ද, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලබා දෙන ජීවිත සහතික විදේශ විශ්‍රාම වැටුප් අංශය මඟින් ද දත්ත පද්ධතියට ඇතුළත් කළ යුතුය.

28. විදේශගත විශ්‍රාමිකයන් විසින් ලබා දෙන ජීවිත සහතික , සහතික කිරීමේ බලය පහත සඳහන් නිලධාරීන් වෙත පමණක් ලබා දේ.

a) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්
b) විදේශ දූත මණ්ඩල කාර්යාලයන්හි බලයලත් නිලධාරීන්
c) විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ
d) විශ්‍රාම වැටුප් සහකාර අධ්‍යක්ෂ
e) ශාඛා ප්‍රධානී (විදේශ විශ්‍රාම වැටුප්)

අත්සන සහතික කරන තැනැත්තා විසින් තමන්ගේ නම, තනතුර හා කාර්යාලයීය ලිපිනය සඳහන් නිල මුද්‍රාව තැබීම අත්‍යවශ්‍ය වන අතර අසම්පූර්ණ ජීවිත සහතික ප්‍රතික්ෂේප කරනු ලැබේ. එමෙන්ම ඉහත පුද්ගලයන්ගෙන් බාහිරව සහතික කරන ලද ජීවිත සහතික ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.(මෙම කරුණු උක්ත 09 හි අනුමැතිය සඳහා ද ඒ අයුරින්ම බල පැවැත්වේ.)

29. ජීවිත සහතික ප්‍රතික්ෂේප වූ විශ්‍රාමිකයන්ගේ ලේඛනය අදාල වර්ෂයේ අප්‍රේල් 01 සිට අප්‍රේල් 30 දක්වා දෙපාර්තමේන්තු වෙබ් අඩවිය මඟින් ලබාගත හැකිය. එසේ ප්‍රතික්ෂේපිත ජීවිත සහතික සඳහා පමණක් නැවත ජීවිත සහතික ලබාදීමට සහන කාලයක් එම වර්ෂයේම අප්‍රේල් 01 සිට අප්‍රේල් 30 දක්වා ලබාදේ. මාර්තු 31 වන දිනට ජීවිත සහතික ලබා නොදුන් හා අප්‍රේල් 30 වන විට අසම්පූර්ණ ජීවිත සහතික වෙනුවෙන් නිවැරදි ජීවිත සහතික ඉදිරිපත් නොකළ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් ගෙවීම එම වර්ෂයේ මැයි මස සිට තාවකාලිකව නතර කිරීමට කටයුතු කරනු ලැබේ.

30. මැයි මස විශ්‍රාම වැටුප් නතර කළ පසුව යම් විශ්‍රාමිකයෙක් ජීවිත සහතික ලබා දුනහොත් ඔහුගේ විශ්‍රාම වැටුප විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අනුමැතිය මත ගෙවීම් කරනු ලැබේ. ජීවිත සහතික ලබා නොදීම මත අවුරන ලද විශ්‍රාම වැටුප එකතු වූ විශ්‍රාම වැටුපක් ලෙස ගෙවීමට කටයුතු කරනු ලැබේ. ඒ සඳහා ඉහත (19) ඡේදයෙහි පරිදි එකතු වූ විශ්‍රාම වැටුප් ඉල්ලීමට කටයුතු කිරීම විශ්‍රාමිකයා විසින් සිදු කළ යුතුය.

**31. ජීවිත සහතික ලබා නොදීම මත තාවකාලිකව ගෙවීම් අත්හිටුවනු ලබන තානාපති කාර්යාල/ මහ කොමසාරිස් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සක්‍රීය කිරීම ඉහත (11) ඡේදයෙහි දැක්වෙන ආකාරයට බැංකු ගිණුම් විවෘත කිරීමෙන් පසු පමණක් සිදු කරනු ලබන අතර මින් ඉදිරියට විශ්‍රාම වැටුප් ගෙවීම අදාළ බැංකු ගිණුම් හරහා පමණක් සිදු කරනු ලැබේ.**

32. මුදල් හුවමාරු කිරීම ඇතුළු බැංකු කටයුතු සඳහා ජීවිත සහතික ලබා දීමට ඉහත(26) ඡේදයෙහි පරිදි ම කටයුතු කළ යුතුය.

**33. මෙම චක්‍රලේඛය 2018.03.31 දින සිට බලාත්මක වේ.**

34. විශ්‍රාම වැටුප් වියදම් කළමනාකරණයේ දී ඔබ දක්වන සහය ඉතා අගය කොට සලකමි.

35. රාජ්‍ය පරිපාලන,කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ එකඟතාව මත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

ඒ.ජගත් .ඩී. ඩයස්
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

| | |
|---|---|
| පිටපත් - ජනාධිපති ලේකම් | - කරු.දැ.ගැ.ස |
| අග්‍රාමාත්‍ය ලේකම් | - කරු.දැ.ගැ.ස |
| අමාත්‍ය මණ්ඩල ලේකම් | - කරු.දැ.ගැ.ස |
| ලේකම් , රාජ්‍ය පරිපාලන,කළමනාකරණ සහ නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| ලේකම් , විදේශ කටයුතු අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස හා අ.ක.ස |
| ලේකම් , මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| ලේකම් , ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස හා අ.ක.ස |
| ලේකම් , ආරක්ෂක අමාත්‍යාංශය | - කරු.දැ.ගැ.ස |
| අධ්‍යක්ෂ ජනරාල්,භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව | - කරු.දැ.ගැ.ස හා අ.ක.ස |
| විගණකාධිපති | - කරු.දැ.ගැ.ස |
| වාණිජ බැංකු, සාමාන්‍යාධිකාරීවරුන් / සභාපතිවරුන් | - කරු.දැ.ගැ.ස හා ඔබගේ සියළුම ශාඛා දැනුවත් කරමින් අ.ක.ස |